රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 21/2017(I)

මගේ අංකය : Pns/P5/නව විශ්‍රාම වැටුප් ක්‍රමය-Tem 01
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය.
කොළඹ 07.

2026.02.18

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2016.01.01 දිනට පසු රාජ්‍ය සේවයට බඳවාගත් නිලධරයන් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් ලබාදීමට අදාළව පත්වීම් ලිපිය සංශෝධනය කිරීම**

2026 අයවැය යෝජනා අනුව, 2016.01.01 දිනට හෝ ඉන්පසු රාජ්‍ය සේවයට බඳවාගන්නා ලද සියලුම රාජ්‍ය නිලධරයන් සඳහා නිකුත් කරනු ලැබූ පත්වීම් ලිපිවල විශ්‍රාම වැටුප් පිළිබඳ වූ වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීම සඳහා අංක: අමප/26/0061/816/002 හා 2026.01.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත.

**"මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය."**

02. ඒ අනුව ඉහත විධිවිධාන, 2016.01.01 වැනි දිනෙන් පසු ලබාදෙන පත්වීම් ලිපි සඳහා අනුකූල කර ගත යුතු වේ.

03. එසේම ඉදිරියේදී රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන නිලධරයන්ගේ පත්වීම් ලිපිවල ද විශ්‍රාම වැටුප් පිළිබඳ වන වගන්තිය ඉහත පරිදි සඳහන් කළ යුතු වන අතර, එය රජය විසින් තත්කාලයේ ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් වේ.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

මෙම රාජ්‍ය පරිපාලන
රාජ්‍ය 21/2017(I) චක්‍රලේඛය/
~~උපදෙස් ලිපිය~~ 26/01/19 දින සිට දකුණු
පළාත්සභාවට අදාල කර ගැනීම
සඳහා ගරු අණ්ඩුකාරතුමන්ගේ
අනුමැතිය 2026/02/26 දින ලබා දී ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාර ලේකම්/සහකාර ලේකම්/පරි.නි.

කේ.පී.එස්.දමයන්ති
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

Scanned with CamScanner